# Abstract 25

## සම්පත් කළමනාකරණය: බෞද්ධ ඉගැන්වීම්වල ප්‍රායෝගික අගය

**යූ. ඒ. සී. සුමුදුමලී,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*chathurisumudumalie@gmail.com*

ජලය, වාතාශ්‍රය, මහපොළොව, වෘක්ෂලතා, සතා සිව්පා ආදී මේ සියල්ල ම අපට අත්‍යවශ්‍ය සම්පත් ය. මේ කිසිවක් නොමැතිව මිනිසාට ජීවත් විය නො හැකි ය. රටක සම්පත් පරිහරණය පිළිබඳව ලෝකය පිළිගත් න්‍යායයන් දෙකකි. එනම් **ධනවාදී ආර්ථික ක්‍රමය** සහ **සමාජවාදී න්‍යායික ක්‍රමය** යනුවෙනි. මේ දෙක ම නූතනය වන විට අසාර්ථක වී තිබෙනු පෙනේ. මෙය අසාර්ථක වීමට ප්‍රධානතම හේතුව වී ඇත්තේ අසීමිත මිනිස් ආශාවන් හා අවශ්‍යතාවන්, සීමිත සම්පත් ප්‍රමාණයක් මඟින් ඉටු කරලීමට වෙර දැරීම යි. බෞද්ධ සම්පත් කළමනාකරණයේ මූලික න්‍යාය වන්නේ සීමිත සම්පත්වලට සරිලන සේ තම අවශ්‍යතාවන් පාලනය කරගැනීම යි. අධිපරිභෝජනය ලෝකයේ සංවර්ධනය වූ රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද දක්නට ලැබෙන ලක්ෂණයකි. ඇතැම් දිළිඳු රටවල ද සමාජයේ කොටසක් පමණක් අධිපරිභෝජනයෙහි යෙදේ. අධිපරිභෝජනයට හේතුව මහිච්ඡතාව යි. ඒ සඳහා පිළියම අල්පේච්ඡතාව යි. එය සෘණාත්මක සංකල්පයක් නොව ධනාත්මක සිතිවිල්ලකි. නූතන ලෝකයේ පුද්ගල වටිනාකම මනින මිනුම් දණ්ඩ වන්නේ මිනිසා  සතු භෞතික සම්පත් ප්‍රමාණය සලකා බැලීම වන නිසා වැඩි ආත්මීය අභිමානයක් ලබා ගත හැක්කේ වැඩිපුර භෞතික සම්පත් ප්‍රමාණයක් ප්‍රදර්ශනය කිරීමෙනි. එහෙත් බුදුදහම අනුව කහවණු වැස්සකින්වත් මිනිසා තෘප්තියට පත් නොවේ. **අංගුත්තරනිකායයේ වෙපුල්ල සූත්‍රය, කූල සූත්‍රය** ආදි සූත්‍ර දේශනාවලින් සම්පත් කළමනාකරණය පිළිබඳව කරුණු ගෙනහැර දක්වයි. එසේ ම මේ සමඟ අප විසින් කාලය ද මැනවින් කළමනාකරණය කර ගත යුතු වේ. තව ද මානව සම්පත් කළමනාකරණයේ දී අදාළ ප්‍රජාවට ම කාර්යය පවරා එය පවත්වාගෙන යාමට පසුබිම සකස් කර දීම දක්ෂ කළමනාකාරවරයෙකු සතු කාර්යභාරයකි. බෞද්ධ විග්‍රහයට අනුව නිවැරදිව සම්පත් කළමනාකරණය තුළින් රටක දියුණුව පමණක් නොව මිනිසාගේ දියුණුව ද සලසා ගත හැකි ය. මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරෙනුයේ බෞද්ධ ඉගැන්වීම අනුව සම්පත් කළමනාකරණය විෂයයෙහි යොදා ගත හැකි සිද්ධාන්ත කවරේ ද යන්න සෙවීම සහ ඒවායෙහි ප්‍රායෝගික අගය කෙබඳු ද යන්න හඳුනා ගැනීම ය.

**ප්‍රමුඛ පද :** අධිපරිභෝජනය, කළමනාකරණය, බුදුදහම, මහිච්ඡතාව, සම්පත්